7 APR 1997

# ලොවවටා පැතිරුන සහලේ වරුණ

වී ගස කවද කොතැනකදී මිනිසා විසින් පලමුවරට සොයාගනු ලැබුවේද යන්න සම්බන්ධයෙන් අතිශය නිවැරදි තොරතුරු ඉතිහාසයෙන් දැනගත නොහැකිය. කෙසේ වෙතත් වී ගසේ නිජබිම අග්නිදිග ආසියාව විය යුතුය. වී ගසේ අයිතිය සම්බන්ධයෙන් විවිධ රටවල් විවිධ අයිතිවාසිකම් කියන බව නම් පැහැදිලිය. චීන ජාතිකයෝ වී ගසේ නිජබිම චීනය යයි කියති. මෙය ප්‍රකාශ කරනු ලබන්නේ ක්‍රි.පූ. 2800 දී පමණ චිං-හුං අධිරාජයා විසින් නිකුත් කල ආඥපණතක් ගෙන හැර පාමිනි. ගොයම් ගසේ නිජබිම ඉංදියාවේ යයි ඉංදියානු ජාතිකයෝද ගොයම් ගසේ නිජබිම ජපානයේ යැයි ජපන් ජාතිකයෝද කියති. ගොයම් ගසේ උපත සිදුවූයේ ඉහත කී රටවල් තුනෙන් කුමන රටක හෝ වේවා අද ලෝකයේ සහල් නිපදවන ප්‍රධාන රටවල් 3 එකී රටවල් වෙයි. මුළු ලෝක නිෂ්පාදනයෙන් 90% ක් පමණ මෙම රටවල් තුන හා ආසියාවේ අනිකුත් වී නිපදවන රටවල් නිපදවන අතර, 10%ක් පමණ අමෙරිකාව, ඉතාලිය, යුරෝපය, ස්පාඤ්ඤය, හා මැද පෙරදිග යන රටවල් නිපදවයි.

ග්‍රැමිනෝ නම් තෘණ පවුලට අයත් ගොයම් ගස ඕට්ස්, රයි, සහ තිරිඟු වැනි පැලෑටිවලටද නෑකම් කියයි. මෙම තෘණ පවුලට අයත් වී ගස විවිධ දේශගුණික කලාපයන්හි හොඳින් වැවේ. ලොව පවත්නා නිවර්තන දේශගුණික කලාපයන්ට අදාලව වැවෙන වී වර්ග රාශියක් ඇත. ඓතිහාසික වාර්තා අනුව වී වර්ග 7000 ක් 8000 ක් පමණ ඇතැයි ගණන් බලා ඇති අතර ඉන් 4000 ක් පමණ ඉන්දියාවේ වගා කරනු ලබයි. වී ගස පහත් බිම් කඳු බෑවුම් මඩ බිම් ආදී ඕනෑම බිමක වැවෙයි. විශේෂයෙන් දකුණු ආසියාතික ගංගා නිම්න ආශ්‍රිතව ඉතාමත් සාර්ථක ලෙස මෙම වී ගස වැවෙන බව කිව හැක.

ශ්‍රී ලංකාවේ ඈත අතීතයේ සිට වී වර්ග රාශියක් ප්‍රචලිතව ඇති අතර මෙම වී වර්ග වලින් බොහොමයක අද ඉතිරිව ඇත්තේ ඒවායේ නම් පමණකි. ඒ වෙනුවට නූතන තාක්ෂණ ක්‍රම වලට ඔරොත්තු දෙන කෙටි ජීවිත කාලයක් සහිත අධික අස්වනු ලබන වී වර්ග රැසක් දැනට ශ්‍රී ලංකාවේ වී වගාවට එකතුවී ඇත.

ශ්‍රී ලංකාවේ මුල් කාලයේ සිට පැවත ආ වී වර්ග රාශියක් ඇතත් ඒවායේ වැදගත් වන වී වර්ග කිහිපයක නම් මෙසේ දැක්විය හැකිය. හීනටි, මුතුසම්බා, දහනල්, බුන්තැස්, දේවරැද්දිරි, මලමරියම් හා මානික්කම්, මල්වාරන්, සුදුමානික්කන්, රතු මානික්කන්, කළු මානික්කන්, ඉලංකාලි, ඉලංග මට්ටල්, ඉලංකට්ටල්, කොට්ටිකාරන්, රට හද්දිරම්, රත්හන්දිරම්, තඹලිංගම්, ආනමාලු, මාවී, බාලනවී, හැටදවී, කුරුවී, සුදුවී, කුරුළුතුඩ වී, කුඩාරන්, ලොකුරන්, අඩුමාරා, දික් වී, හීන්දික්වී, කිරිකාර, සුදුකාර රටතවාලු, කළුකඳ, පැරණිබොර, කපුටුහොට, මුරුංගා වී, කහරමනා, කහටම්බා ආදී වශයෙන් දැක්විය හැකිය. එමෙන්ම ශ්‍රී ලංකාවේ සම්ප්‍රදයික ගොවීන් අතර ඉතාමත් ප්‍රචලිත ඇල්වී වර්ග රැසක්ද ඇති අතර ඒවායින් සමහරක්ද නම් වශයෙන් මෙසේ වෙයි. රුවන් ගල්, බරුහාල්, කිරිබරුහාල්.

ඉහතකී වී වර්ග වගා කල ගොවියා පුරාණයේ සිටම විවිධ චාරිත්‍ර රැසක් අනුගමනය කලහ. කුඹුර හෝ හේන කෙටීමට ආරම්භ කරන මොහොතේ සිට අස්වනු ලබා ගන්නා තෙක්ම මෙම විවිධ චාරිත්‍ර නොපිරිහෙලා ඉටු කලහ. නියමිත වේලාවකට කෙතට හෝ හේනට යාම නැකතට වැඩ ඇල්ලීම සුබ දිනයන් වල වී වැපිරීම, විවිධ යාතු කර්ම අස්වනු නෙලීමට පෙර දෙවියන්ට පිදීම ගොවිපල හතරවට ආරක්ෂාව යන්ත්‍ර මංත්‍ර ජප කිරීම කමත් වල චාරිත්‍ර චාරිත්‍ර අනුගමනය කෙත්වලට නියම වූ කෙත් භාෂාවක් ඒ ප්‍රදේශ වලට අනුව භාවිතා කිරීම ආදී චාරිත්‍ර චාරිත්‍ර රැසක් පිළිපදිමින් ගොවිතැන් කටයුතු කලහ.

මේ හැම දෙයකින්ම ගොවියා බලාපොරොත්තු වූයේ අදෘශ්‍යමාන බලවේගයක් තුලින් ගොවිපලවලට සෙත්සාන්තිය ලබාගෙන අස්වනු වැඩි කිරීමයි. ඒ බව මෙම ජන කවි වලින් පැහැදිලි වෙයි.

ඉහල වෙලේ තියන බතා—පහල වෙලේ තියන බතා
අටුකොටුවල තියන බතා—ඇද පූරවන් මේ කමතා

මෙම වී වගාව ආශ්‍රිත චාරිත්‍ර වාරිත්‍ර අද පවා නැතිවා නොවේ. මෑතකාලීනවද වී ගොවියා ශුභ වේලාවන් අනුව චාරිත්‍ර වාරිත්‍ර අනුගමනය කලත් ආදි කාලීන ගොවියා තරම් ඒ ගැන පිළිපැදීමක් දැකිය නොහැකිය. විශේෂයෙන් නූතන ව්‍යාපාරික කාර්යක් ලෙස වී වගාව කරන ගොවියා මෙම චාරිත්‍ර ගැන සැලකිල්ලක් එතරම් දුරට නොමැති අතර ඔහු නූතන තාක්ෂණික ක්‍රම ශිල්ප අනුගමනය කර රසායනික ද්‍රව්‍ය පොහොර භාවිතා කර උපරිම අස්වැන්නක් ගැනීමට උත්සාහ කරයි. මෙහිදී අදෘශ්‍යමාන බලවේග වලින් අස්වනු වැඩිවන තෙක් ගොවියා බලා නොසිටී.

පැරණි වී වර්ග භාවිතය මෑතකාලීන වශයෙන් අඩුවීමට හා සමහර වී වර්ග සම්පූර්ණයෙන්ම භාවිතයෙන් අයින්වීමට මූලික හේතුව එද ගොවියා වී වර්ග වල අස්වැන්න සම්බන්ධ දැඩි සැලකිල්ලක් නොදැක්වූ අතර, වී වර්ග වල උසස් බව අනුව වගා කිරීම. අද ගොවීන් වී වල උසස් බවට වඩා ආර්ථිකමය වශයෙන් දැඩි වාසිදයක අධික අස්වනු ලැබිය හැකි, කෙටි ජීවිත කාලයක් ඇති වී වර්ග වලට නැඹුරුවී ඇත. මෙහිදී මූලික වශයෙන් එද ගොවියාට වඩා අද ගොවියාගේ ආකල්ප ආර්ථිකමය පැත්තට වැඩි නැඹුරුවක් ඇතිවී ඇත. එමෙන්ම සම්ප්‍රදයික වී වර්ග වලට වැඩි කාලයක් අවශ්‍ය වන අතර නූතන වී වර්ග ඉතාමත් කෙටිකාලීනව අස්වනු ලැබිය හැකි නිසා ඒවා කෙරේ වැඩියෙන් නැඹුරු වී ඇත.

## රස මීරයි මුළුතුන් ලොවට අධිපති

සක්වල සමන් දෙවියෝ යැදුමට ගනි      ති
නිම්මා නැති රටේ ජනයෝ ළහා වෙ      ති
මම් මේ කියන කවි පද සරුප බොරු නැ      ති
අම්මා පල්ල ගෙඩියේ නම ගසට නැ      ති

ගසට නමකි ගස මැරුනම වෙන නම      කි
ගෙඩියට නමකි ගෙඩියේ සුඹුලට නම      කි
මදට නමකි මද කනවිට වෙන නම      කි
මෙතුන් පදේ තෝරාලා කියන් ස      කි

ගසට නම තමයි වේනාවෙන් කිය      නා
ගෙඩියේ නම වෙනයි බාසාවෙන් දෙඩ      නා
සුඹුලේ නම වෙනයි කොනකට අසුර ව      නා
මදේ නම තමයි අපි සැවොමත් බුදි      නා

ගසට ගොයම වෙයි මළ විට පිදුරු වෙ      ති
සුඹුලට දහය්යා ඇටයට වී කිය      ති
මදයට හාල් කියමින් එය බතට ක      ති
මෙතුන් පදේ තේරුම මේ විලස වෙ      ති

ඉස   සිදුරුයි   බාලේ ළමයින්ටනැ      ති
දවසින්   දවස කරරු ති   කුස මෙදර      ති
රස   මීරයි   මුළුතුන් ලොවට අදි ප      ති
තිර   සාරයි   මවගේ නම පුතුට නැ      ති

(සිංහල ජනකවි)